

# සසල දිවිමග නිසල කරනට

**(ආතතිය, මානසික පීඩනය පාලනය කරගැනීමට අත්වැලක්)**

**පූජ්‍ය බෝධි චිත්තා මෙහෙණින් වහන්සේ**
මෙල්බන් නුවර නිසල අරණ

11

## දැවෙන සිත් නිවී සැනසේවා

## විද්‍යාවට අනවශ්‍ය ලෙස අප බිය විය යුතු ද?

බුදුදහමේ ආභාෂය ඇතිව විද්‍යාව ඉගෙන ගන්නෙකුට විද්‍යාවේ ඇති ළඳරු බවත් බුද්ධ ධර්මයේ ඇති පරිපූර්ණ බවත් නොතේරෙන්නේ නොවේ. විද්‍යාව පිළිබඳ මනා දැනුමක් තිබීම ධර්මය මනා කොට අවබෝධ කර ගැනීමට හේතුවක් වන බවට මෙකලින් කදිම සාක්ෂි සොයාගත හැකිය.

මාගේ ජීවිත කතාව විද්‍යාඥවරියක් ගැන නොව පැවිද්දෙකු වශයෙන් සටහන් කිරීමට සිදුවන්නේ ද මේ නිසා බව පෞද්ගලිකව මට කිව හැක. දෙස් විදෙස් බොහෝ බුද්ධිමතුන්ගේ ගෞරවාදරයට පාත්‍ර වූ දහම් පඬි රුවනක් වූ, බොහෝ සැනසිලිදායක, අර්ථවත් පැවදි දිවියක් ගත කරන්නා වූ සීලයෙන් ගුණයෙන් අනූන වූ ශ්‍රී ලාංකීය මහා ථෙර නමක් වූ කැනඩාවේ නායක අති පූජ්‍ය ආචාර්ය මඩවල පුණ්ණජි ස්වාමීන්ද්‍රයාණන් වහන්සේද ගිහි කල වෛද්‍යවරයෙකි. එසේම ලොව ප්‍රකට ඕස්ට්‍රේලියාවේ පර්ත් නුවර ආරණ්‍යවාසී වූ, ගුණයෙන් නුවණින් අනූන වූ නිවී සැනසුන අල්පේච්ඡ පැවිදි දිවියක් ගත කරන අචාන් බ්‍රහ්මවංශ හිමියන්ද ගිහි කල භෞතික විද්‍යාඥයෙකු විය.

අනුක ජීව විද්‍යාවෙහි ආචාර්ය උපාධියක් ඇති, ගිහි කල නොබෙල් ත්‍යාගයක් හිමි වූ පර්යේෂණායක නියැලි කණ්ඩායමක සිටි, මැතිව් රිකාඩ් නම් විද්‍යාඥයකුද දළයි ලාමාතුමා යටතේ පැවිදිව සිටි. ලොව සතුටින්ම සිටින්නේ කවුද යන්න ගැන විද්‍යාත්මක පර්යේෂණයකින් සෙවීමට, පෙර අපරදිග රජුන්, ප්‍රධානීන්, ප්‍රභූන් බලවත් දේශපාලඥයින්, ධනවත් ව්‍යාපාරිකයින් ප්‍රසිද්ධ ගායක ගායිකාවන්, නළු නිලියන්, විද්වතුන් සාමාන්‍ය, මධ්‍යම පාන්තිකයින්, දුප්පතුන්, විවිධ රැකියාවන්වල නිරත වූවන් හා නොවූවන්, ඉගෙන ගන්නා පාසල් දරු දැරියන්, විශ්ව විද්‍යාල සිසු සිසුවියන්, ආචර්ය - මහාචාර්යවරුන් ඇතුළුව විවිධ ජාති, ආගම්, කුල, පංති වලට අයත් සමාජයේ සෑම පැතිකඩක්ම නිරූපණය වන පරිදි සිය දහස් ගණනක විශාල පිරිසකගේ සහභාගිත්වයෙන්) 2003 සිට කෙරුණු පර්යේෂණ වලදී, (මෙහිදී ප්‍රධාන වශයෙන් මොළයේ ක්‍රියාකාරිත්වය, විශේෂයෙන්ම සතුට පිළිබඳ වගකිව යුතු ස්ථාන පරීක්ෂණයකට භාජනය කෙරුණි) " ලොව සතුටින්ම හා සැනසිල්ලෙන් සිටින්නා" ලෙසට මෙම භික්ෂුව තෝරී, මුළු මහත් බෞද්ධයන්ටම ගෞරවයක් හිමිකර දුනි. වර්ෂ 2007 දී මෙය මාධ්‍ය විසින් වාර්තා කර තිබුයේ "World's happiest man is a Buddhist monk" (ලොව හිතේ සතුට වැඩිපුරම ඇතිව ජීවත්වන්නා බෞද්ධ භික්ෂුවකි) යනුවෙනි. මෙම සිද්ධිය බෞද්ධ දර්ශනයේ ඇති වටිනාකම නිහඬවම ලෝකයාට හඬ ගා පෑමක් වූ අතර, බටහිර ලෝකයාගේ අවධානය බුදුදහම වෙතට නිරායාසයෙන්ම යොමු වීමටත්, බුද්ධිමතුන් මෙම වටිනා දහම අධ්‍යනය කිරීමට නැඹුරු වීමටත් මෙය හේතුවක් විය.

මෙහි මා ගෙන හැර පෑවේ මා දන්නා, බුදු දහම ලෝ පතල කිරීමට උර දෙන්නා වූ විද්‍යාත්මක පසුබිමක් ඇති උත්තම පුද්ගලයන් කීප දෙනෙකු පමණි. තව එමට උදාහරණ ඇතත් ඒවා මෙහි ලැයිස්තු ගත කිරීම අනවශ්‍ය යැයි මට සිතේ.

මෑත ශතවර්ෂයේදී ලොව පහළ වූ බුද්ධිමත්ම (Highest I.Q) පුද්ගලයා හැටියට ගැනෙනුයේ විද්‍යාවේ පියා ලෙස සලකනු ලබන ඇල්බට් අයින්ස්ටයින් ය. වරෙක මොහු ප්‍රකාශ කෙරුවේ "Science without religion is blind & religion without science is lame" යනුවෙනි. මෙය සරලව කියතොත්, ආගමක මග පෙන්වීමක් නැති විද්‍යාව යා යුතු මග නොදැන, අතරමං වන විද්‍යාවක් වන අතර, විද්‍යාවත් සමග නොපෑහෙන ආගම ඉදිරියට නොයන නොපැතිරෙන එක්තැන් වූ ආගමක් වන බවය. මෙම ගැඹුරු හා දූරදර්ශී කියමනේ තේරුම වැටහෙන්නා හට මානව වර්ගයාගේ සුභ සිද්ධිය උදෙසා විද්‍යාව හා ආගම අතර කුමන ආකාරයක සබඳතාවක් පැවැත්විය යුතුද යන්න වැටහේ.

### විද්‍යාවේ ඇරඹුම

විද්‍යාවේ සුලමුල ගැන අප යමක් දැන සිටීමද වැදගත් වේ. එකල බටහිර (අපරදිග) රටවල තිබුණු කතෝලික/ක්‍රිස්තියානි ආගම්වලට අනුව දෙවිකෙනෙකුන් විසින් ලොව මවන ලදී යන්නත්, දෙවියන්ගේ කැමැත්තට අනුව සියලු දේ සිදුවන බවත් සියලු දෙනා විසින් විශ්වාස කළ යුතු විය. මෙයින් පිටස්තරව සිතීමද මහා පාපකර්මයක් යැයි කියා නිදහසේ සිතීමට පවා එරෙහිව තහංචි පනවා තිබුණි. ලෝකය ගැන හා සිදුවන සිදුවීම් දෙස තර්කානුකූලව බැලූ, සමහර බුද්ධිමතුන්ට සර්වබලධාරී මැවුම්කාර දෙවිකෙනෙකුන් ගැන සැක පහළ වීම නිසා ලෝකයේ සත්‍ය ස්වභාවය කුමක්දැයි සොයන්නට සිත්වින.



ආගමේ ඇති අන්ධ විශ්වාසයන් ගැන කලකිරී, දෙවිකෙනෙකුන් ලෝකය මැවූ බවට තිබූ විශ්වාසය පසෙකලා, ජීවිතය පරදුවට තබා මෙම සුළු, බුද්ධිමත් පිරිස පල්ලියට විරුද්ධව, හොර රහසේ ආගම් විශ්වාසයන්ගෙන් නිදහස් ව ස්වාධීන චින්තකයන් ලෙස ලෝකයේ සත්‍ය ස්වභාවය සෙවීමට පටන් ගත්හ. මෙසේ බුද්ධියට මුල් තැන දුන් ස්වාධීන චින්තකයන් ගේ බිහිවීම, දාර්ශනිකයන්ගේ පහල වීම විද්‍යාවේ පටන් ගැනීම විය. මෙම 16 - 18 වන ශත වර්ෂවල ඇති වුන චින්තන පෙරලිය "Age of Enlightenment" නැතහොත් "විද්‍යා පුනරුදය" යනුවෙන් ඉතිහාසයේ සඳහන් වේ.

විද්‍යාවේ දී අන්ධ ලෙස කිසි දෙයක් පිළිනොගන්නා අතර, හේතු සාධක සහිතවම, කරුණු ඔප්පු වූ පසු ඒවා තව කවුරුන් හෝ වැරදි යැයි ඔප්පු කර ඊට වඩා උසස් සත්‍යයක් හෙලිකරන තුරු මුලින් ඔප්පු කළ දේ පිළිගනී. මානව වර්ගයාගේ බුද්ධියේ දියුණුවත් සමඟම විද්‍යාවේ සොයා ගැනීම් වලද නිවැරදිතාවය වැඩිවෙමින් පවතී. ආගම දහමක බලපෑමෙන් තොරව ස්වාධීන චින්තනයකින් යුතුව සත්‍ය ගවේෂණායක යෙදෙන්නෝ දාර්ශනිකයන් හා විද්‍යාඥයින් යනුවෙන් දෙකොට්ඨාශයකි. ආගම දහමකින් කෙරෙනුයේ මිනිසාට හොඳ නරක, හරි වැරදි ගැන වැටහීමක් ඇතිකර මිනිස් සිතේ සතුට සාමය ඇතිකර සුවසේ, නිවී සැනසුන ජීවිත ගත කිරීමට පමණක් නොව, පරලොව යහපත් කරගැනීමට ද, මග පෙන්වීමයි. ආගමේ තිබූ අන්ධවිශ්වාසයන් පිළිගැනීමට තිබූ අකමැත්ත නිසා විද්‍යාඥයින් ආගමේ උගන්වන්නා වූ, සියළු දේ විසිකර එයට පයින් ගැසුවේ ("Throwing the baby with the bath water" බබෙක් නාවා හමාර වී එම කිළුටු වතුරත් සමග දරුවාද විසි කරන්නාක් මෙනි.)

විද්‍යාවේ පියා කල්තියා මෙහි ඇති භයානකකම දුටුවේය. විද්‍යාවේ දියුණුවත් සමග සමාජ, මනුස්ස ගුණ ධර්ම බිඳවැටෙන සැටි දැක බිරාන්ත වූ ඔහු මෙයට පිළියමක් දැමීමටද, විද්‍යාවේ දියුණුවත් සමග නැති ප්‍රශ්න ඇති වීම වැලැක්වීමටද, නැවත මිනිසා ආගම දහමට කිට්ටු කිරීමටද අසාර්ථක උත්සාහයක් ගත්තේය. ඔහු පැතුවේ මිනිසාගේ සුව සෙත, සතුට හා සාමය පිණිස යොදාගන්නා විද්‍යාවක් මිස, මිනිසා මිනිසාගේම විනාශය ළඟා කරගැනීමට යොදා ගන්නා විද්‍යාවක් නොවේ. නමුත් මිනිසා මිනිසාගේම විනාශය පිණිස තම බුද්ධිය මෙහෙයවා කටයුතු කිරීමත්, අඥාන ලෙස හැසිරීමත් ගැන ඔහු සිටියේ බොහෝ කලකිරීමෙනි.

මිනිසාගේ බුද්ධියද දෙපැත්ත කැපෙන්නා වූ රන් කඩුවක් මෙනි. මෙය නියම උපදේශයකින් තොරව පාවිච්චි කරන්නවුන් ඔවුන්ගේ හා අනුන්ගේ විනාශය ළඟා කරගන්නේ දැලි පිහි අතට ගත් වඳුරන් මෙනි. නියම මාර්ග උපදේශයකින් තොරව දියුණු කර ගන්නා බුද්ධිය තරම් තවත් දරුණු ආයුධයක් මානව වර්ගයා සතු නොවේ. මන්ද මෙම නොමග ගිය බුද්ධිය විසින් කරනුයේ තම ලෝභ, ද්වේශ, මෝහ සන්තර්පනය කිරීමට දියුණු විද්‍යාවද යොදා ගැනීමයි.

**මතු සම්බන්ධයි**

FOR ALL YOUR TRANSLATIONS
PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)

(ENGLISH < > SINHALESE)

Documents for immigration purposes
BIRTH , MARRIAGE, DEATH
EDUCATIONAL/ VOCATIONAL
LEGAL and POLICE DOCUMENTS
NATIONAL IDENTITY CARDS

CONTACT
**DR. PREMA KUDALIGAMA**
( BA, PGDE, M.A. Ph.D(Edu.)
NAATI Level 3 (Interpreting & Translating)
Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premakudali@ gmail.com
**BUNDOORA, VICTORIA 3083**